**පන්නල ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පන්නල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පන්නල ප්‍රාදේශීය සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍යප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයෙහි මුද්දර ගාස්තු ආදායම රු.70,320,914 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ දී ලද උසාවි දඩ රු.2,720,747 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | මාකඳුර ළමා උද්‍යානයෙහි ආරක්ෂිත වැට ඉදිකිරීම් වටිනාකම රු.626,595 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | වාහන සේදුම් ස්ථානයේ ගබඩා කාමරය ඉදිකිරීමේ සහ මාකඳුර ළමා උද්‍යානයේ වැලි ඇතුරුම් යන කර්මාන්තවල එකතු වටිනාකම රු.393,909 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2022 සහ 2021 වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෙවීම් කරන ලද විගණන ගාස්තු රු.393,300 ක් සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 17කට අදාළ ලෙජර ගිණුම් සහ උපලේඛන වල එකතු අතර රු.9,772,355 ක වෙනසක් විය. | 2024 අවසන් ගිණුම සකස්කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් වලට හේතු හඳුනා ගෙන පරීක්ෂාකර නිවැරදි කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 59,622,077 | කාල විශ්ලේෂනය | 2024 අවසන් ගිණුම් සකස් කිරීමේදී එම විශ්ලේෂණ වාර්තා සමග ඉදිරිපත් කරන බව | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | | |
| 134 වගන්තිය | සභාව විසින් සේවා සපයන සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කර වරිපනම් අය කර නොතිබුණි. | නව වරිපනම් කලාපය තුල දියුණු ගම් ප්‍රදේශ හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | දියුණු ගම් ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | 1988 වර්ෂයේ සිට නොපිය වූ රු.119,374ක අත්තිකාරම් පැවතුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571 (2) | කල් ඉකුත් වූ රු. 20,032,475 ක් තැන්පතු නිදහස් කිරීමට හෝ හිමිකම් නොපාන තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ඇ) | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| (i) | 59 රීතිය | කර්මාන්ත ලැයිස්තුවක් පිළියෙල කර මාර්තු 31 දිනවන විට සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරැදි කර ගැනීමට කටයුතු කරන බව | නිවරදි කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 218 රීතිය | පත් කළ මණ්ඩලයක් විසින් වාර්ෂික ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන බව | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සමීක්ෂණයක් කාලීනව සිදුකළ යුතුය. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 27 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාවක් සිදු කිරීමට සැලසුම් කර ඇති බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඉ) පළාත් පාලන චක්‍රලේඛ

| | | | | |
|---|---|---|---|---|
| (i) | අංක 2018/elocal government 01 හා 2018/ ජූලි 19 දිනැති චක්‍රලේඛය | අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හා ගෙවීම් කටයුතු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා නොතිබුණි. | මූලික පියවර ගෙන ඇති අතර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | අංක 2010/02 හා 2010/ ජූලි 30 දිනැති චක්‍රලේඛයේ 1.2. ii. වගන්තිය | විෂය මාරු ක්‍රමයක් හා එසේ සිදු කිරීම අපහසු නිලධාරින් සඳහා වසර 02 කට වරක් කොට්ඨාස මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | ඉදිරියේදි රාජකාරී වෙනස්කිරීමට කටයුතු කරන බව | -එම- |
| (iii) | අංක 03/2015 හා 2015/නොවැම්බර් 02 දිනැති චක්‍රලේඛය | වීදි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | වීථි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන බව | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.77,462,461 ක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.96,940,370 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සභාවට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ වටිනාකමින් රු.9,922,230 ක් තවදුරටත් පැවතුණි. | ඉදිරියේදී නිරාකරණය කර ගැනීමට කටයුතු කරන බව | ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) |
| | රු.000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 15,263 | 12,431 | 10,597 | 1,833 | 15,362 | 13,932 | 14,257 | 2,562 |
| කුලී | 33,841 | 30,527 | 27,927 | 2,600 | 32,469 | 30,154 | 26,730 | 3,674 |
| බලපත්‍ර ගාස්තු | 1,551 | 1,274 | 1,274 | - | 1,551 | 956 | 996 | - |
| වෙනත් ආදායම් | 26,286 | 17,741 | 20,618 | - | 20,564 | 16,674 | 17,021 | - |
| එකතුව | 76,941 | 61,973 | 60,416 | 4,433 | 69,946 | 61,716 | 59,004 | 6,236 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,480,960 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂයක්සහ රු.122,914 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවතුණි. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ආ) | අවම ලංසු වටිනාකම රු.114,987 ක් වූ වත්කම් 07 ක් සමාලෝචිත වර්ෂයේ බදු දී නොතිබුණි. | 2023 වර්ෂයේ මෙම වත්කම් 07 ටෙන්ඩර් කිරීම සිදු කලද බදු ලබා ගෙන නොමැති බව | සභාව සතු වත්කම් වලින් ආදායම් උපයාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,197,265 ක කඩකුලී වටිනාකමක් අයවිය යුතු ව පැවතුණි. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු උසාවි දඩ රු.29,537,748 ක් හා 2021 ජූලි මාසයේ සිට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.124,320,914 ක් විය. | ලැබිය යුතු මුදල් අය කිරීමට කටයුතු කරන බව | මෙම මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | 2019 ජනවාරි 20 දිනැති වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2019/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 03 කට වරක් කඩකාමර කුලිය තක්සේරු කළ යුතු වුව ද, සභාව සතුව බදු දී තිබූ කඩකාමර 136 ක් තක්සේරු කර බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම රැස් කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 20 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරන බව | ආදායම් උපයාගත හැකි අවස්ථා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පනවාගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් ප්‍රාග්ධන වැය රු.591,000 ක් හා පුනරාවර්තන වැය රු.27,404,068 ක් දරා තිබුණ ද කසළ අලෙවියෙන් ලද ආදායම රු.908,275 ක් වී තිබුණි. | කාබනික පොහොර සඳහා විශාල ඉල්ලුමක් පැවතියද මේ වන විට එම ඉල්ලුම අඩුවීම මත මෙවන් ආදායම් අඩු වී ඇති බව | කසළ විධිමත්ව කළමනාකරණය කර ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක වටිනාකම රු.255,002,969 ක් විය. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | ලැබියයුතු මුදල් අයකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 04ක එකතු වටිනාකම රු.265,725,299ක් විය. | ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව | ගෙවියයුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය සේවකයින් 12 ක ගෙන් රු.583,310 ක සේවක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | හිඟ මුදල් ද අය කර ගැනීමට කටයුතු කරන බව | සේවක ණය පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.8,632,166 ක් වූ ගොඩනැගිලි 02 ක් මාකඳුර උප කාර්යාලීය ස්ථාවර වත්කම් ලේඛනවල සටහන් කර නොතිබුණි. | ලේඛන වල සටහන් කරන බව. | වත්කම් ලේඛනගත කල යුතුය. |
| (ආ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි, ලී බඩු හා උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. | එකඟ වන බව. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යුතුය. |
| (ඇ) | සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 50 ක් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා ඇති අඩුපාඩු නිවරදි කිරීමට කටයුතු කරන බව | සුසාන භූමි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 176 ක් වූ අතර පුරප්පාඩු 49 ක් පැවතුණි. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | කාර්යය මණ්ඩල අවශ්‍යතාවය කාලීනව සමාලෝචනය කර ගත යුතුය. |

### 3.5 වාහන පද්ධති කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් පරිහරණය කරනු ලබන වටිනාකම රු.7,500,000 ක් වූ JCB යන්ත්‍රය, ඩබල් කැබ් රථය සහ ජීප් රථයේ අයිතිය ප්‍රාදේශීය සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කරමින් පවතින බව | සභාව නමින් ලියාපදිංචිය ලබාගත යුතුය. |
| (ආ) | වටිනාකම රු.1,500,000 ක් වූ ස්කැවේටර් රථය සහ වටිනාකම රු.5,000,000 ක් වූ නිශාන් වර්ගයේ ගිනි නිවන රථය නිශ්කාර්යව පැවතුණි. | විගණනය සමඟ එකඟ වන බව | සභාව සතු වාහන දිරාපත් වීමට නොදී පිළිසකර කර භාවිතයට ගැනීමට හෝ එසේ නොහැකි වාහන අපහරණය කිරීමය කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂර්ක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉටුකළ යුතු කර්තව්‍යයන් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද , එහි දී හඳුනාගත් විශේෂිත ක්‍රියාකාරකම් 45 ක් අතුරින් 06 ක ප්‍රගතිය සියයට 30 – 75 ත් අතර මට්ටමක පැවතුණි. | 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරන බව | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම් අතර සියයට 13 ත් 42 අතර විචලනයක් පැවති අතර වියදම් විෂයයන් 08 ක ඇස්තමේන්තුගත හා සත්‍ය වියදම් අතර සියයට 30 ත් 81 අතර විචලනයන් පැවතුණි. | විගණනයෙන් පෙන්වා ඇති අඩුපාඩු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව | තාත්වික ලෙස ඇස්තමේන්තු සකස් කල යුතුය. |

## 4.3 තිරසර සංවධර්න ඉලක්ක

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු 14 ක් යටතේ හඳුනා ගෙන තිබූ ජයග්‍රහණ දර්ශක 55 ක් අතුරින් දර්ශක 21 ක සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා ජයග්‍රහණ ලැබීමේ ප්‍රගතිය සියයට 75 ට අඩු මට්ටමක පැවතුණි. | හඳුනාගත් තිරසාර ඉලක්ක වලට අදාලව වැඩසටහන් ඉටුකිරීමට කටයුතු කරන බව දන්වමි. | හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු කරා ළගාවීමට කටයුතු කල යුතුය. |